ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1773/34 - 2012 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2012.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියෝගය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇත්තා වූද, එම ලේඛනයෙහි II වැනි තීරයේ තදානුරූපීව මායිම් හා ඉම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ප්‍රදේශය හා I වන උපලේඛනයෙහි දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින් ඒ එක් එක් ප්‍රදේශය එම වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශ විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

එසේම දැනටමත් ප්‍රකාශයට පත් කර ඇති I වන උපලේඛනයේ සඳහන් ප්‍රදේශ ද ඇතුළුව II වන උපලේඛනයේ II වන තීරුවේ සඳහන් ප්‍රදේශය ද, හික්කඩුව නාගරික සංවර්ධන බල ප්‍රදේශයේ මායිම් තුළට ඇතුළත් විය යුතු බව ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,<br>
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍ය.

2012 ජූනි මස 25 වැනි දින,<br>
අංක. 15/5,<br>
බාල දක්ෂ මාවත,<br>
කොළඹ 03,<br>
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**I උපලේඛනය**

| | | |
|---|---|---|
| *ගැසට් නිවේදන අංක 116/6* | - | හික්කඩුව නගර සභා බල ප්‍රදේශයේ කොටසක් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස 1980.11.26 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී. |
| *ගැසට් නිවේදන අංක 196/14* | - | හික්කඩුව නගර සභා බල ප්‍රදේශයේ කොටසක් තිරාණගම සහ නාරිගම ග්‍රාම නිලධාරි කොට්ඨාස නාගරික සංවර්ධන ප්‍රදේශ ලෙස 1982.06.11 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී. |
| *ගැසට් නිවේදන අංක 223/16* | - | හික්කඩුව නගර සභා බල ප්‍රදේශයේ වෙරළ බඩ කලාපයේ කි. මී. 01 ක ප්‍රදේශයක් නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස 1982.12.17 වැනි දින ප්‍රකාශයට පත් කරන ලදී. |

1A - G 016531 — 345 (2012/08)

**II උපලේඛනය**

හික්කඩුව නගර සභා බල ප්‍රදේශයේ ප්‍රකාශයට පත් කර නොමැති ප්‍රදේශය
නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

*I තීරුව*

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හික්කඩුව නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටියා වූ අංක 59 D වැල්ලවත්ත, අංක 59 E නාකන්ද, අංක 59 A හික්කඩුව අංක 59 හික්කඩුව නගරය, අංක 59 B හික්කඩුව මධ්‍යම, අංක 58 A වවුලාගොඩ නැගෙනහිර අංක 59 වවුලාගොඩ බටහිර, අංක 57 A පන්නම්ගොඩ, අංක 57 B මිල්ලගොඩ, අංක 59 C නලාගස්දෙණිය, අංක 56 B කුඩා වැවල, අංක 55 B දෙල්ගහදූව, අංක 57 වැවල, අංක 56 A නාරිගම වැල්ලබඩ, අංක 56 නාරිගම, අංක 54 තිරාණගම, අංක 55 කටුකොහොලිය, අංක 55 A පින්කන්ද, අංක 55 C හඳඋඩුමුල්ල, අංක 54 A තිරාණගම වැල්ලබඩ අංක 53 B හෙන්නතොට, අංක 53 පටුවන අංක 53 A ගම්මඩුවත්ත, අංක 52 A දොඩන්දූගොඩ, අංක 52 මෝදර පටුවත, අංක 51 දොඩන්දූව, අංක 51 A උඩුගල්පිටිය යන ග්‍රාම නිලධාරී කොට්ඨාසවලින් සැදුම්ලත් දෙවන තීරුවේ විස්තර වන ඉම් සහ මායිම්වලින් සමන්විත වූ මුළු මහත් භූමි ප්‍රදේශය.

*II තීරුව*

*උතුරට :*

තුරුලතා තීරය ඔස්සේ වැටී ඇති වැල්ලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් ඡේදනය වන ලක්ෂයේ සිට අංක 59 D වැල්ලවත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ඊශාන දෙසට හා ගිණිකොන දෙසට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට අංක 59 E නා කන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ඊසාන දෙසට හා නැගෙනහිර දෙසට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිනිකොණ දෙසට අංක 59 B හික්කඩුව මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන තෙක්ද එතැන් සිට එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට අංක 59 B හික්කඩුව මධ්‍යම ග්‍රාම නිලධාරී කොට්ඨසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂය දක්වා ද, එතැන් සිට අංක 59 B එකී ග්‍රාම නිලධාරී කොට්ඨසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට හා නිරිත දෙසට අංක 59 C නලාගස්දෙණිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට 59 C එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට හා නිරිත දෙසට අංක 56 B කුඩා වැවල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට අංක 56 B ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ඊශාන දෙසට අංක 55 B දෙල්ගහදූව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම හමුවන තෙක්ද, එතැන් සිට අංක 55 B දෙල්ගහදූව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ඊශාන දෙසට හා ගිනිකොන දෙසට අංක 55 A පින්කන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු සහ බටහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට අංක 55 A එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ නැගෙනහිර දෙසට හා නිරිත දෙසට අංක 55 C හඳඋඩුමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට අංක 55 C හඳඋඩුමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උතුරු මායිම ඔස්සේ ගිණිකොන දෙසට, ඊශාන දෙසට හා ගිණිකොන දෙසට එකී අංක 55 C ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද,

*නැගෙනහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට අංක 55 C හඳඋඩුමුල්ල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට, දකුණු දෙසට හා නිරිත දෙසට මීටර් 1110 ක් දුරින් අංක 55 C එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට අංක 55 C එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ නිරිත දෙසට හා වයඹ දෙසට අංක 55 A පින්කන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද, එතැන් සිට අංක 55 A එකී ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට හා ගිණිකොන දෙසට

**II** උපලේඛනය (සම්බන්ධිතයි)

*I තීරුව*

*II තීරුව*

*නැගෙනහිර :* (සම්බන්ධිතයි)

අංක 55 A පින්කන්ද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හමුවන තෙක්ද එතැන් සිට අංක 55 A එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ වයඹ දෙසට හා නිරිත දෙසට අංක 53 B හෙන්නතොට ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම හමුවන තෙක්ද අංක 53 B එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ නිරිත දෙසට අංක 52 A දොඩන්දුගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට අංක 52 A එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම ඔස්සේ ගිණිකොන දෙසට හා නිරිත දෙසට අංක 51 දොඩන්දූව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන තෙක්ද, එතැන් සිට අංක 51 දරන එකී ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම් ඔස්සේ ගිණිකොන දෙසට අංක 51 A උඩුගල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නැගෙනහිර මායිම් ඔස්සේ ගිණිකොන දෙසට හා නිරිත දෙසට කොළඹ - ගාල්ල මාර්ගය හරහා වෙරළ සීමාවේ හරිත තීරය හමුවන තෙක් ද,

*දකුණට :*

අංක 51 A උඩුගල්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දකුණු මායිම හා හරිත තීරය හමුවන ස්ථානය

*බටහිර :*

අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට හරිත තීරය ඔස්සේ වයඹ දෙසට ආරම්භක ලක්ෂය හමුවන ස්ථානය දක්වා ප්‍රදේශය.

09-415

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.